# 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රුහුණ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් පනවනු ලබන ශිෂ්‍ය නේවාසික සහ විනය සම්බන්ධ අතුරු නීතිය.

සභාපති/ උපකුලපති
රුහුණ විශ්වවිද්‍යාල පාලක සභාව.

2015 ජනවාරි මස 12 වැනි දින දීය.

**අතුරු නීති**

**1.** මෙම අතුරු නීතිය 2015 අංක 01 දරන ශිෂ්‍ය නේවාසික සහ විනය සම්බන්ධ අතුරු නීතිය යනුවෙන් හඳුන්වනු ලබන අතර , 2015 ජනවාරි මස 12 වැනි දින සිට බලාත්මක විය යුතු ය.

**2.** (මෙහි මින් මතු ''විශ්වවිද්‍යාලය '' යනුවෙන් හඳුන්වනු ලබන) රුහුණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින්ගේ නේවාසික සහ විනය සම්බන්ධයෙන් අදාළ වූ සහ මෙම අතුරු නීතිය ක්‍රියාත්මක වන දිනයේදී බලාත්මකව පවතින්නා වූ යම් අතුරු නීතියක් මෙම අතුරු නීතිය ක්‍රියාත්මක වන දින සිට බලාත්මක වන පරිදි පරිච්ඡින්න කරනු ලැබේ.

**3.** **(1)** (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත, ශිෂ්‍ය නේවාසික සහ විනය මණ්ඩලයක් පිහිටවනු ලැබිය යුතුය.

(අ) නියෝජ්‍ය උපකුලපතිවරයා

(ආ) එක් එක් පීඨයේ පීඨාධිපති

(ඇ) විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී

(ඈ) විශ්වවිද්‍යාලය පත් කරනු ලබන විනය පාලක

(ඉ) ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක

(ඊ) එක් එක් නේවාසික ශාලාවෙහි පාලකවරුන්

(උ) ප්‍රධාන වෛද්‍ය නිලධාරි සහ

(ඌ) උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන (මෙහි මින්මතු ''පත් කල සාමාජිකයන්'' ලෙස හඳුන්වනු ලබන) සනාතන සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු.

**(2)** නියෝජ්‍ය උපකුලපතිවරයා මණ්ඩලයේ සභාපති විය යුතු අතර ,මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක

පැමිණ සිටින පීඨාධිපතිවරුන්ගෙන් ජ්‍යෙෂ්ඨ පීඨාධිපතිවරයා මුලසුන දැරිය යුතුය. නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති හා ලේඛන ) මණ්ඩලයේ ලේකම් විය යුතුය.

**4.** සිසුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් අදාළ කාරණා සහ විනය ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් කලින් කල සමාලෝචනය කොට උපකුලපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ශිෂ්‍ය නේවාසික සහ විනය මණ්ඩලයේ කාර්ය භාරය වේ.

**ශිෂ්‍ය විනය හා නේවාසික අතුරු නීතිය යටතේ උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරය, පීඨාධිපති, විනය පාලක සහ නියෝජ්‍ය විනයපාලක ගේ කාර්යභාරය.**

**5.** **(1)** සිසුවකු හෝ සිසුන් විසින් සිදු කරනු ලබන යම් විනය විරෝධී ක්‍රියාවක් හෝ විෂමාචාරයක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, පීඨාධිපති ,ප්‍රධාන ආරක්ෂක නිලධරයා , අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හෝ පරිපාලන කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු , විශ්වවිද්‍යාලයේ යම් සේවා නියුක්තයකු හෝ සිසුවකු විසින් ප්‍රමාදයකින් තොරව , උපකුලපතිවරයා හෝ නියෝජ්‍ය උපකුලපතිවරයාට දැනුම් දීමට කටයුතු කළ යුතුය.

**(2)** නියෝජ්‍ය උපකුලපතිවරයා විසින් යම් විෂමාචාරයකට අදාළ තොරතුරු රැස් කර , ඒ සම්බන්ධයෙන් වහාම පියවර ගෙන උපකුලපතිවරයාට වාර්තා කළ යුතුය.

**(3)** මෙම අතුරු නීතිය යටතේ උපකුලපතිවරයා විසින් එවැනි තොරතුරු ලැබුණු විට ඒ පිළිබඳව වැඩිදුරටත් තොරතුරු අවශ්‍ය යයි සලකන්නේ නම් , ප්‍රමාදයකින් තොරව සිද්ධිය වූ ස්ථානයට ගොස් කාරණා සම්බන්ධයෙන් පරීක්ෂා කොට ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් විනය මණ්ඩලයක් නම් කළ යුතුය.

**(4)** උපකුලපතිවරයා විසින් ඉහත අංක 03 හි ඉදිරිපත් කරන ලද වාර්තාවක් සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි අතර, උපකුලපතිවරයාට සුදුසු යැයි හැගේ නම් තීරණය පාලක සභාවට දැනුම් දිය හැකිය.

**6.** **(1)** උපකුලපතිගේ එකඟත්වය පරිදි විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයේ පීඨාධිපතිවරයාට පීඨයේ සියලු සිසුන්ගේ විනය සම්බන්ධ අධීක්ෂණ පාලනයක් ක්‍රියාත්මක කිරීමට බලය ඇත්තේය.

**(2)** යම් පීඨයක පීඨාධිපතිවරයාට සිය පීඨයේ සාමකාමී පැවැත්මට යම් සිසුවකුගේ හෝ සිසුන්ගේ කළහකාරී හැසිරීම හෝ පැවැත්ම හේතුවෙන් බාධාවක් ඇති බවට හෙළිදරව් වී ඇති අවස්ථාවක උපකුලපතිගේ එකගත්වය පරිදි නියෝජ්‍ය උපකුලපති සහ පීඨාධිපතිවරයා විසින් එකී පීඨයේ නියෝජ්‍ය විනය පාලක සහ අධ්‍යයන අංශ ප්‍රධානීන්ගේ සහයෝගය ඇතිව පහත සඳහන් පියවර ගත යුතුය

**(අ)** අදාළ කළහකාරී හැසිරීම සම්බන්ධයෙන් එම සිසුවා හෝ සිසුන්ට

අවවාදයක් නිකුත් කිරීම.

**(ආ)** එම සිසුවා හෝ සිසුන් විශ්වවිද්‍යාලයට හෝ දේශන වලට සහ පාඨමාලාව වලට හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් පාඨමාලාවක් සඳහා සහභාගී වීම සති දෙකක් නො ඉක්මවන කාලයකට තාවකාලිකව අත්හිටු වීම.

**(ඇ)** එකී සිසුවාගේ හෝ සිසුන්ගේ හැසිරීම සම්බන්ධ සිදුවීම සඳහා විශ්වවිද්‍යාල උපකුලපතිගේ මැදිහත් වීම අවශ්‍ය බවට පීඨාධිපතිගේ මතය වන අවස්ථාවක දී ඒ සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා උපකුලපතිවරයාට වාර්තා කිරීම.

**(3)** මෙම අතුරු නීති යටතේ ගන්නා ලද විනය ක්‍රියාමාර්ග වල ස්වභාවය පීඨාධිපති විසින් උපකුලපතිවරයාට වාර්තා කරනු ලැබිය යුතු ය.

**7.** **(1)** උපකුලපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ විනය පාලක වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු (උදා :ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු හෝ සහය මහාචාර්යවරයකු) පත්කරනු ලැබිය හැකිය.

**(2)** විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය විනය පවත්වාගෙන යාමට ,විනය පාලක සහයෝගය ලබා දිය යුතුය.

**(3)** ඉහත කාර්යය ඉටු කිරීමේදී ,විනය පාලක විසින් උපකුලපති, නියෝජ්‍ය උපකුලපති ගෙන් විමසා  නියෝජ්‍ය විනය පාලකවරුන්ගේ සහාය ඇතිව ක්‍රියා කරනු ලැබිය යුතුය.

**(4)** විනය පාලක නියෝජ්‍ය උපකුලපතිගේ උපදෙස් මත විශ්වවිද්‍යාලයේ විනය කඩවීම පිලිබඳ පැමිණිලි විභාගකර වාර්තා ලබාදීමට පියවර ගනු ලැබිය යුතුය.

**(5)** පරීක්ෂණයක නිගමනයක් අනුව යම් ශිෂ්‍යයකුගේ විනය විරෝධී ක්‍රියාවක් හෝ අයහපත් හැසිරීමක් සිදුවී ඇති බවට විනය පාලක සෑහීමට පත් වේ නම් උපකුලපතිගේ එකඟත්වය පරිදි නියෝජ්‍ය උපකුලපති වෙත වාර්තා කර පහත සඳහන් දඬුවම් වලින් එක් දඬුවමක් නියම කරනු ලැබිය හැකිය.

**(අ)** ලිඛිත අවවාදයක්

**(ආ)** සති 2ක් නොඉක්මවන කාලයක් අදාල සිසුවාට විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීම.

**(6)** මෙම අතුරු නීතිය යටතේ ක්‍රියාත්මක වන සෑම අවස්ථාවකම විනය පාලක විසින් උපකුලපතිට සහ නියෝජ්‍ය උපකුලපති වෙත වාර්තා කළ යුතුය.

**(7)** විනයපාලක විසින් පනවනු ලබන යම් දණ්ඩනයකින් අතෘප්තියට පත් වන යම් සිසුවකුට වහාම ඒ පිලිබඳව උපකුලපතිවරයා වෙත අභියාචනා කිරීමට අයිතියක් ඇති අතර උපකුලපතිවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබයි නම් දණ්ඩනය පිලිබඳ විමර්ෂණය කිරීම හෝ විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කිරීම කරනු ලැබිය හැකිය.

**(8)** විනය විරෝධී සිදුවීම් පිළිබඳ වාර්තා වී ඇති අවස්ථාවකදී . විනයපාලක විසින් ඒ පිළිබඳ විමසා බලා සති දෙකක කාලයක් ඇතුලත උචිත පියවරක් ගැනීම සඳහා ස්වකීය නිගමනයන් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**8.** **(1)** උපකුලපතිවරයා විසින් නියොජ්‍ය උපකුලපති සහ පීඨාධිපති ගෙන් විමසා එක් එක් පීඨය සඳහා නියෝජ්‍ය විනය පාලකවරයකු වශයෙන් ජොෂ්ඨ කථිකාචාර්යවරයකුගේ තත්වයට අඩු නොවන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකිය.

**(2)** විනයපාලකගේ කර්තව්‍ය ඉටුකිරීමේදී ඔහුට සහාය වීම සඳහා එක් පීඨයකට එක් නියෝජ්‍ය විනයපාලකවරයෙක් වශයෙන් සියලුම පීඨවලට නියෝජ්‍ය විනය පාලකවරු පත් කරනු ලැබිය හැකිය.

**(3)** යම් පීඨයක නියෝජ්‍ය විනයපාලක විසින් පීඨයේ සිසුන් අතර විනය පවත්වාගෙන යාම සඳහා පීඨාධිපතිට සහාය ලබාදිය යුතුය.

**(4)** නියෝජ්‍ය විනයපාලක විසින් යම් විනය විරෝධී ක්‍රියාවක් හෝ විෂමාචාරයක් පිලිබඳව විමර්ශනය කර නියෝජ්‍ය උපකුලපති වෙත වාර්තා කරනු ලැබිය හැකිය.

**(5)** යම් විමර්ශනය කිරීමක් අවසන් කිරීමෙන් පසුව අදාළ ශිෂ්‍යයා යම් විනය විරෝධී හෝ විෂමාචාරයක වගකිව යුතු බවට නියෝජ්‍ය විනය පාලක සෑහීමට පත්වන්නේ නම් උපකුලපතිගේ එකඟත්වය පරිදි නියෝජ්‍ය උපකුලපති වෙත වාර්තා කර පහත දැක්වෙන දඬුවම් වලින් එක් දඬුවමක් නියම කරනු ලැබිය හැකිය.

**(අ)** ලිඛිත අවවාද කිරීමක්

**(ආ)** සති එකකට නොවැඩි කාලයක් සඳහා එම ශිෂ්‍යයා විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවීම

**(6)** එසේ දඬුවමක් පැනවීමෙන් පසුව නියෝජ්‍ය විනයපාලක විසින් වහාම ඒ පිලිබඳව උපකුලපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයා, පීඨාධිපති, විනයපාලක, නියෝජ්‍ය ලේඛකාධිකාරී / ජොෂ්ඨ සහකාර / සහකාර ලේඛකාධිකාරී(නීති හා ලේඛන) / (ශිෂ්‍ය කටයුතු) සහ (විභාග)සහ වෙනත් යම් අදාල නිලධරයකු වෙත දැනුම් දිය යුතුය.

**ශිෂ්‍ය විනය විරෝධී ක්‍රියා හෝ විෂමාචාර**

**9.** **(1)** අධ්‍යයන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු ,නේවාසිකාගාර ශාලාධිපති හෝ උපශාලාධිපති විසින් නිකුත් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයක් ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන;

**(2)** විශ්වවිද්‍යාල යම් දේපලක් විනාශ කරනු ලබන, ඒවාට අලාභ හානි කරන ලබන , විකෘති කරනු ලබන, අන්සතු කරනු ලබන , ඉවත් කරනු ලබන , සොරකම් කරනු ලබන හෝ අයුතු ලෙස යොදාගැනීම කරනු ලබන;

**(3)** යම් තැනැත්තකුට තුවාල සිදු කල හැකි අවි ආයුධ , තියුණු උපකරණ , බෝම්බ හෝ පුපුරන ද්‍රව්‍ය හෝ වෙනත් යම් විනාශකාරී ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන හෝ සන්තකයේ තබාගෙන සිටින;

**(4)** වෙනත් අයට පහර දෙන , තුවාල කරනු ලබන ,හිරිහැර කරනු ලබන , පීඩා කරනු ලබන ,බාධා කරනු ලබන සහ කලහ කරනු ලබන;

**(5)** විශ්වවිද්‍යාලය ඇතුලතදී හෝ ඉන් පිටතදී විශ්වවිද්‍යාලයේ යම් ශිෂ්‍යයකුට හෝ කාර්ය මණ්ඩල සාමාජිකයකුට වාචිකව හෝ ලිඛිතව තර්ජනය කරනු ලබන විශ්වවිද්‍යාලයේ යම් තැනැත්තකුට තුවාල සිදු කරනු ලබන හෝ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකුට හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට පීඩා කරනු ලබන ,ඔහුගේ කීර්ති නාමයට හානි කරනු ලබන හෝ විශ්වවිද්‍යාල දේපලට හානි කරනු ලබන;

**(6)** යම් සාවද්‍ය හැසිරීමක් සිදු කරන හෝ සාවද්‍ය හැසිරීමකට හෝ අසාධාරණ ක්‍රියාවකට උපකාර කරනු ලබන;

**(7)** නවක වදය සිදුකරන හෝ නවක වදය සිදු කිරීමට සහභාගි වන හෝ නවක වදය සිදු කිරීමට අනුබල දෙන හෝ නවක වදය ලබාගැනීමට කැමැත්තෙන් සහභාගී වන ;

**(8)** අකීකරු ලෙස හැසිරෙන හෝ අවස්ථාවට උචිත නොවන ආකාරයට අදින පළදින;

**(9)** විශ්වවිද්‍යාලයේ යම් ශිෂ්‍යයකුගේ හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ ස්වාධීනත්වය සහ ගමන් කිරීමේ නිදහසට බාධා වන යම් ක්‍රියාවක් සිදු කරනු ලබන;

**(10)** විශ්වවිද්‍යාලයේ යම් ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් යම් විධානයක් ක්‍රියාත්මක කිරීමෙන් වලක්වනු ලබන ආකාරයෙන් එම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා හෝ කර්ය මණ්ඩලයේ සාමාජිකයා නීති විරෝධී ලෙස වලක්වාලනු ලබන;

**(11)** විශ්වවිද්‍යාලයේ යම් ශිෂ්‍යයකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් ඇතැම් සීමා වලින් පරිබාහිරව ක්‍රියා කිරීමෙන් වලක්වාලනු ලබන ආකාරයෙන් එම විශ්වවිද්‍යාල ශිෂ්‍යයා හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයා නීති විරෝධී ලෙස වලක්වාලනු ලබන;

**(12)** විශ්වවිද්‍යාලය විසින් සත්‍ය විස්තර ලබා ගැනීමට හිමිකමක් ඇති යම් කරුණක් පිළිබඳව විශ්වවිද්‍යාලයට සාවද්‍ය තොරතුරු සපයනු ලබන;

**(13)** සාවද්‍ය ප්‍රකාශ සපයා විනය පරීක්ෂණ වලදී පරීක්ෂකවරුන් නොමග යවනු ලබන;

**(14)** විශ්වවිද්‍යාල ආරක්ෂක සේවයට හෝ විශ්වවිද්‍යාලයේ වෙනත් යම් තැනැත්තන් වෙත සාවද්‍ය ප්‍රකාශ කරනු ලබන හෝ සපයනු ලබන;

**(15)** විභාගවලට සහභාගි වීමේදී වෙනත් අයට බාධා කරනු ලබන, හෝ විභාග ශාලා අසල හෝ අවට අයුතු ලෙස රැස්ව සිටින;

**(16)** අධ්‍යයන කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට , නේවාසිකාගාර ශාලාධිපතිට ,උපශාලාධිපතිට ,ආරක්ෂක නිලධාරියකුට හෝ වෙනත් යම් අදාළ නිලධාරියෙකුට විශ්වවිද්‍යාල මගින් නිකුත් කරන ලද හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම හෝ එසේ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන;

**(17)** උපකුලපතිවරයාගේ මතය අනුව යම් සදාචාර විරෝධී ක්‍රියාවකට එරෙහිව විනයානුකූල ක්‍රියාකිරීම සඳහා බලයදීම සඳහා ප්‍රමාණවත් වන වරදක් සඳහා යම් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබ ඇති;

**(18)** විශ්වවිද්‍යාල පරිශ්‍රය ඇතුලත මත්පැන් පානය කිරීම හෝ මත් ද්‍රව්‍ය වල බලපෑමට යටත් වූ හෝ සන්තකයේ තබාගෙන සිටින හෝ මත්පැන් අඝ්‍රාණය සහිත බවට හෝ මත්පැන් හෝ සංකලනය කරන ලද මත්ද්‍රව්‍ය මිළට ගන්නන් බවට හෝ සැපයීම කරනු ලබන බවට අනාවරණය කරගත් ;

**(19)** ඉගැන්වීමේ වැඩසටහන්වලට (දේශන, ප්‍රායෝගික , ක්ෂේත්‍ර වැඩ , වැඩමුළු ක්‍රියාකරකම් , සායන , පැවරුම් ආදී), විභාග සහ විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සඳහා බාධා සිදු විය හැකි ක්‍රියාකාරකම්වල යෙදෙන හෝ යම් පරිපාලන කටයුතුවලට බාධා සිදු කරනු ලබන;

**(20)** යම් විශ්වවිද්‍යාල නිලධරයකුගේ , සේවකයකුගේ කාර්ය ඉටුකිරීමේ දී එම නිලධරයාට හෝ සේවකයාට බාධා කිරීම, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු සඳහා අයුතු ලෙස මැදිහත් වන;

**(21)** යම් ශිෂ්‍යයකුගේ අධ්‍යයන කටයුතු හෝ පර්යේෂණ කටයුතු පවත්වාගෙන යෑම සඳහා බාධා කරන හෝ යම් ශිෂ්‍යයකුගේ ක්‍රියාකාරකම්වලට බාධා ඇති කරනු ලබන;

**(22)** උපකුලපතිවරයාගේ මතය අනුව විශ්වවිද්‍යාලයේ කීර්ති නාමයට අහිතකර ආකාරයට ක්‍රියා කරනු ලබන හෝ විශ්වවිද්‍යාලයේ යථා පැවැත්ම සහ විනය පවත්වා ගැනීම සඳහා අහිතකර ලෙස ක්‍රියා කරනු ලබන ;

හෝ

**(23)** විශ්වවිද්‍යාලයේ අතුරු නීති , නියෝග හෝ රීති උල්ලංඝණය කරනු ලබන;
යම් ශිෂ්‍යයකු විනය විරෝධි ක්‍රියා හෝ විෂමාචාර පිළිබඳ වරදට වරදකරු වන්නේය.

**10.** ඉහතින්ම වූ 9 වැනි වගන්තියේ විධිවිධාන වලට අමතරව

**(අ)** විශ්වවිද්‍යාලයේ පාලක සභාවෙන් අනුමැතිය ලබා නොමැති විශ්වවිද්‍යාලයේ යම් සමිතියක හෝ සංගමයක රැස්වීමක් කැඳවන ලෙස අදහස් කරන ලද හෝ යම් සමිතියක් හෝ සංගමයක් පිහිටවීමට අදහස් කරන හෝ පිහිටුවීමට සහාය වන;

**(ආ)** විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කර නොමැති යම් සමිතියක් හෝ සංගමයක් නියෝජනය කරනු ලබන;

**(ඇ)** යම් සමිතියක් හෝ සංගමයක් පිහිටුවීම සඳහා පාලක සභාව විසින් සාදන ලද රීති සහ නියෝග සමග එකගව ක්‍රියා නොකරන;

**(ඈ)** ව්‍යවස්ථා නියමවලට පටහැනි ලෙස විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වනු ලබන යම් ශිෂ්‍ය රැස්වීමක් කැඳවීම හෝ එයට සහභාගී වන;

**(ඉ)** විශ්වවිද්‍යාල බලධාරීන්ගේ පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව විශ්වවිද්‍යාල පරිශ්‍රය ඇතුළත යම් කටයුත්තක් සැලසුම් කරන ,සංවිධානය කරන හෝ ක්‍රියාත්මක කරනු ලබන;

(ඊ) උපකුලපතිවරයාගේ හෝ නියෝජ්‍ය උපකුලපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව යම් වාර සඟරාවක් ,ප්‍රකාශනයක් පත්‍රිකාවක් බෙදා හරින හෝ ප්‍රදර්ශනය කරනු ලබන හෝ විශ්වවිද්‍යාලයට අයත් දේපල විකෘති කරනු ලබන හෝ අවලක්ෂණ කරනු ලබන;

(උ) උපකුලපතිවරයාගේ හෝ නියෝජ්‍ය උපකුලපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව ,විශ්වවිද්‍යාලයේ දී ශිෂ්‍යයන් ඇමතීම සඳහා ශිෂ්‍යයින් වෙනුවෙන් හෝ ශිෂ්‍යයින්ගේ ඉල්ලීම පරිදි හෝ ශිෂ්‍යයකු වශයෙන් විශ්වවිද්‍යාලයට පිටතින් යම් කථිකයකු ගෙන්වීම සඳහා ආරාධනය කරන ලබන;

(ඌ) උපකුලපතිවරයාගේ හෝ නියෝජ්‍ය උපකුලපතිවරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හෝ ඉන් පිටතදී මුදල් හෝ භාණ්ඩ එකතු කිරීම සඳහා කටයුතු සූදානම් කරනු ලබන හෝ සංවිධානය කරනු ලබන;

(එ) උපකුලපතිවරයාගේ හෝ නියෝජ්‍ය උපකුලපතිවරයාගේ හෝ උපකුලපතිවරයා විසින් තත්කාර්ය සඳහා නම් කරන ලද වෙනත් යම් ආචාර්යවරයකුගේ හෝ නිලධරයකුගේ පූර්ව අනුමැතිය නොමැතිව විශ්වවිද්‍යාලයට, අදාල කරුණු හා සම්බන්ධව නිකුත් කරනු ලබන යම් පුවත්පත් නිවේදනයක් තමා විසින් ම හෝ ශිෂ්‍ය සංගමයක , සමිතියක හෝ සංවිධානයක යම් නියෝජිතයකු හෝ නියෝජිතයකු වශයෙන් නිකුත් කිරීම හෝ පළකිරීම හෝ පළකිරීමට සැලැස්වීම කරනු ලබන යම් ශිෂ්‍යයකු විනය විරෝධී ක්‍රියා හෝ අයථා හැසිරීම සම්බන්ධයෙන් වූ වරදකට වරදකරු වන්නේය.

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය නේවාසිකාගාර.**

**11.** **(1)** විශ්වවිද්‍යාල නේවාසිකාගාර මනා සහ සක්‍රීය කළමනාකරණය සහතික කිරීම සඳහා උපකුලපතිවරයාට නියෝජ්‍ය උපකුලපතිවරයාට වගකියනු ලැබිය යුතු එක් එක් නේවාසිකාගාරයේ ප්‍රධානියා වන නේවාසිකාගාර ශාලාධිපතිවරයකු සිටිය යුත්තේය.

**(2)** විශ්වවිද්‍යාල පාලන අධිකාරියට එදිනෙදා පාලන කටයුතු සඳහා වගකිව යුතු එක් එක් නේවාසිකාගාරයේ උපශාලාධිපතිවරයකු සිටිය යුත්තේය.

**(3)** විනය පවත්වාගෙන යෑම, දේපළ සහ සේවා කළමණාකරණය, ඉන්වෙන්ට්‍රි (භාණ්ඩ තොග) පවත්වාගෙන යාම, ශිෂ්‍ය වාර්තා පවත්වාගෙන යාම සහ නේවාසිකාගාර පාලන නියෝගයන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපශාලාධිපති කටයුතු කළ යුතුය.

**12.** **(1)** නේවාසිකාගාරයක නේවාසිකව සිටීමට අපේක්ෂා කරනු ලබන යම් ශිෂ්‍යයකු

විසින් තමාගේ පවුලේ දෙමාපියන්ගේ ආදායම සහ පදිංචි ස්ථානයේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර ප්‍රමාණය සහ අනෙකුත් තොරතුරු නේවාසිකාගාර ලබාගැනීමේ ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය.

**(2)** නේවාසිකාගාරයේ නවාතැන් ගැනිම සඳහා වූ එවැනි ඉල්ලීමක් විශ්වවිද්‍යාලය විසින් තත් කාර්ය සඳහා සපයා ඇති ආකෘති පත්‍රයකින් ඉදිරිපත් කළයුතු අතර කලින් කල පනවනු ලබන විශ්වවිද්‍යාල නේවාසිකාගාර සඳහා අදාළ වන අතුරු නීති, රීති සහ නියෝග විසින් පිළිගන්නා බවට වූ ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයක් සමඟ සමන්විත විය යුතුය.

**(3)** විශ්වවිද්‍යාලයේ අතුරු නීති ,රීති සහ නියෝගවලට යටත්ව යම් ශිෂ්‍යයකු වෙත තනි පුද්ගල පදනම මත නේවාසික පහසුකම් වෙන්කර දෙනු ලැබිය යුතු ය.

**13.** **(1)** විශ්වවිද්‍යාල බලධාරීන්ගෙන් නිසි අවසරයක් ලබා නොගෙන නේවාසිකාගාරයක කිසිම ශිෂ්‍යයකු රැඳී නොසිටිය යුතුය.

**(2)** දෙන ලද කාල සීමාව ඇතුලත සෑම ශිෂ්‍යයකුම විසින් විශ්වවිද්‍යාලය නියම කරනු ලබන නේවාසිකාගාර ගාස්තු ගෙවිය යුතුය.

**(3)** විශ්වවිද්‍යාලය වෙන් කල නේවාසිකාගාරයේ ලියාපදිංචියක් නොමැතිව කිසිම අයුරකින් ශිෂ්‍යයෙකු තමාට වෙන්කල නේවාසිකාගාරය තුල පදිංචි වීම නොකල යුතු අතර වෙනත් ශිෂ්‍යයකු සමග කාමරය හුවමාරු කර ගැනීම හෝ වෙනත් කාමරයක පදිංචි වීම නොකළ යුතුය

**14.** **(1)** මෙම අතුරු නීති උල්ලංඝනය කිරීම හේතුවෙන් යම් ශිෂ්‍යයකුට ලබා දී ඇති නේවාසික පහසුකම් තාවකාලිකව අත්හිටු වීම සඳහා නේවාසිකාගාර ශාලාධිපතිට බලය ඇත්තේ ය. එවැනි අවස්ථාවක දී නේවාසිකාගාර පහසුකම් අත්හිටු වීමට පෙර ශාලාධිපති විසින් උපකුලපතිවරයාට, නියෝජ්‍ය උපකුලපති වරයාට සහ විනය පාලක වෙත ඒ පිළිබඳ කඩිනම් වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**(2)** යම් අධ්‍යයන වර්ෂයක් හෝ සාමාසිකයක් අවසානයේදී යම් ශිෂ්‍යයකු විභාගයකට පෙනී සිටීමට අපොහොසත් වුවහොත් එම සාමාසිකය සඳහා දේශන අවසන් වී ඇති අවස්ථාවකදී, එවැනි ශිෂ්‍යයකුට නේවාසිකාගාරයක නේවාසිකව සිටීම සඳහා හිමිකම් නොලැබේ.

**(3)** යම් ශිෂ්‍යයකුට එරෙහිව ගන්නා ලද යම් විනයානුකූල පියවරක් හේතුවෙන් නේවාසිකාගාරයේ නවාතැන් ප්‍රදානය කිරීම සඳහා වූ කටයුතු සූදානම් කිරීමේදී යම් බාධාවීමක් හෝ අවසන් වීමක් සිදුවන අවස්ථාවක දී, එම ශිෂ්‍යයා විසින් ගෙවන ලද හෝ ගෙවිය යුතු ගාස්තු ආපසු අයකර ගැනීම හෝ අඩුකර ගැනීම සඳහා එම ශිෂ්‍යයාට හිමිකමක් නොමැත.

**15.** සෑම ශිෂ්‍යයකුම් -

**(අ)** නේවාසිකාගාරයේ ස්වකීය කාමරයේ ඇති ගෘහ භාණ්ඩ , සවිතුරු යනාදිය සඳහා මෙන්ම සාමූහික වශයෙන් පොදු භාවිතයේ පවතින වෙනත් සියලු අයිතම සඳහා ;

**(ආ)** තමා වෙත නිකුත් කර ඇති අයිතමයන් කාමරයෙන් හෝ නේවාසිකාගාරයෙන් ඉවත්ව යන විට විශ්වවිද්‍යාල බලධාරීන් වෙත ආපසු භාරදීම සඳහා ;

**(ඇ)** සපයා ඇති අයිතම සඳහා වන යම් පාඩු හෝ අලාභ හානි සඳහා ;

**(ඈ)** නේවාසිකාගාරයේ ඇති චංචල හෝ නිශ්චල දේපල සඳහා අත්වැරදීමක් වශයෙන් හෝ හිතාමතාම සිදුවන යම් පාඩු සඳහා එම පාඩු වටිනාකම ශිෂ්‍යයා විසින් ගෙවීම සඳහා, ශිෂ්‍යයන් එක් අයකුට වඩා වැඩි දෙනෙකු සම්බන්ධයෙන් වන විට එම දේපල වල වටිනාකම එම නේවාසිකාගාරයේ හෝ කාමරයේ එකට සිටින එක් එක් ශිෂ්‍යයාගෙන් සමාන මුදලින් අයකර ගැනීම සඳහා ;

**(ඉ)** භාවිතා කරනු ලබන කාලසීමාව ඇතුළත සිසුන්ට දෙන ලද ස්ත්‍රික්ක , රූපවාහිනී යන්ත්‍ර සහ වෙනත් උපකරණ හානියක් නොවන අයුරින් පාවිච්චි කිරීම සඳහා ; සහ

**(ඊ)** ස්වකීය කාමරයේ ඇති ගෘහ භාණ්ඩ , සවිතුරු යනාදිය සඳහා පුද්ගලිකව සහ නේවාසිකාගාරයේ අනෙකුත් සියලු පොදු භාවිතය සඳහා වූ අයිතම සඳහා සාමූහිකව; වගකියනු ලැබිය යුතුය.

**16.** කිසිම ශිෂ්‍යයකු විසින් -

**(අ)** කාමරයකට වෙන් කර දී ඇති අයිතමයන් වෙන තැනකට ගෙන යෑම හෝ ඉවත් කිරීම ;

**(ආ)** නේවාසිකාගාරයේ සිටින අනෙකුත් සිසුනට මෙන් ම අසල්වැසියන්ට කිසිම හිරිහැරයක් කරදරයක් සිදු කිරීම හෝ සිදු වන අයුරින් කටයුතු කිරීම, නේවාසික පහසුකම් අවලංගු කිරීමට හේතුවන පහර දීම්, යම් ද්‍රව්‍ය විසි කර දැමීම , අධික ශබ්දය ඇති කිරීම හෝ වෙනත් යම් නොගැලපෙන හැසිරීමක් වැනි විනය විරෝධී ක්‍රියා සිදු කිරීම ;

**(ඇ)** නේවාසිකාගාරයේ යම් මද්‍යසාර බීම වර්ග , මත් ද්‍රව්‍ය හෝ නීති විරෝධී මත් ද්‍රව්‍ය තබා ගැනීම, සන්තකයේ තබා ගැනීම හෝ පරිභෝජනය කිරීම සහ පරිභෝජනය කර නේවාසිකාගාරයට පැමිණ සිටීම ;

**(ඈ)** නේවාසිකාගාරයේ දුම් පානය කිරීම හෝ සූදු ක්‍රීඩාවල යෙදීම ;

**(ඉ)** නේවාසිකාගාරයේ යම් ගිනිකෙළි භාණ්ඩ භාවිතා කිරීම හෝ සන්තකයේ තබා ගැනීම ;

**(ඊ)** නේවාසිකාගාරයේ ආහාර පිසීමේ හෝ පිළියෙල කිරීම;

**(උ)** නේවාසිකාගාරය ඇතුළත වායු සමීකරණ, ශීතකරණ , උඳුන් හෝ සමාන විද්‍යුත් උපකරණ භාවිතා කිරීම. විදුලි පද්ධතිය අයුතු පාවිච්චිය, වෙනස් කිරීම විශ්වවිද්‍යාල පරිපාලනයේ අවසරය නොලත් කාර්යන්ට යොදා ගැනීම ;

**(ඌ)** යම් වාණිජ හෝ නීති විරෝධී කාර්යයක් සඳහා නේවාසිකාගාරයේ කාමර සහ පහසුකම් පාවිච්චි කිරීම , කාමරය හෝ නේවාසිකාගාරයේ යම් කොටසක් යම් කාර්යාලයක් , පුස්තකාලයක් හෝ වෙන යම් දේශපාලන කාර්යාලයක් ,ආගමික

කාර්යාලයක් හෝ ලේකම් කාර්යාල ආයතනයක් වශයෙන් භාවිත කිරීම නොකල යුතු ය ;

**(එ)** උපශාලාධිපතිගේ පූර්ව අනුමැතිය නොමැතිව කාමරවල බිත්ති, කොරිඩෝව හෝ පොදු ප්‍රදේශයන් පෝස්ටර්,පත්‍රිකා හෝ නිවේදන මගින් හානියට පත් කිරීම හෝ සැරසීම ;

නො කළ යුතු ය.

**17.** සෑම ශිෂ්‍යයකු ම විසින් -

**(අ)** නේවාසිකාගාරයේ පදිංචි වන අවස්ථාවේ දී නේවාසිකාගාරයේ කාමරයේ ඇති සියලු නිශ්චල සහ චංචල අයිතමයන් හානියට පත්වී හෝ ක්‍රියාත්මක තත්වයෙන් නොපවතින බවට අනාවරණය වුවහොත් ඒ පිළිබඳව උපශාලාධිපති වෙත දැනුම් දිය යුතු බවට ;

**(ආ)** සංගීත උපකරණ , ශ්‍රව්‍ය උපකරණ , රූපවාහිනී, පරිගණක යනාදිය සියලු අවස්ථා වලදී කාමරයෙන් පිටතට ශ්‍රවණය නොවන පරිදි පවත්වා ගනු ලැබිය යුතු බවට ;

**(ඇ)** නේවාසිකාගාරයෙන් පිටතට සංගීත ශබ්දය යොමු නොවන පරිදි ජනෙල් හෝ සදළුතල මත ස්ටීරියෝ හෝ ශබ්ද විකාශන යන්ත්‍ර නොතබවන බවට ;

**(ඈ)** ප.ව.10.00 සහ පෙ.ව.5.00 යන කාලය තුළ කිසිම සංගීත උපකරණයක් හෝ ගුවන් විදුලියක් ක්‍රියාත්මක නොකරණ බවට ;

**(ඉ)** ශිෂ්‍යයන් හට ලබා දී ඇති ස්ත්‍රික්ක , රූපවාහිනී යන්ත්‍ර සහ වෙනත් උපකරණ වාර අවසානයේ දී ක්‍රියාත්මක තත්වයෙන් ආපසු භාරදී ඇති බවට ;

**(ඊ)** විදුලි සැපයුම නිවැරදි පරිදි භාවිතාකර ඇති බවට සහ (පරිගණක , ස්ටීරියෝ, රූපවාහිණී, කොණ්ඩය වියලන යන්ත්‍ර ආදිය) විද්‍යුත් උපකරණ පරිපථ වල විදුලි ධාරිතාව ඉක්මවා නොගොස් ඇති බවට ;

**(උ)** කාමරවලින් පිටවීමේදී සියලු බල්බ, ස්ත්‍රික්ක , සහ විදුලි පංකා ක්‍රියා විරහිත කර ඇති බවට හෝ භාවිතයෙන් පසුව නාන කාමර සහ ජල කරාම වසා ඇති බවට;

සහ

**(ඌ)** කාමර, කොරිඩෝව , කාණු , ගෙවතු පිරිසිදුව තබා ඇති බවට සහතික විය යුතුය;

**18.** නැති වූ හෝ කැඩී ගිය යතුරු වල වටිනාකම අදාළ ශිෂ්‍යයාගෙන් අයකර ගනු ලැබිය යුතුය.

**19.** සියලු නේවාසික සිසුන් ප.ව.8.00 පෙර නේවාසිකාගාරයට ආපසු පැමිණිය යුතු අතර උපශාලාධිපතිගෙන් පූර්ව අවසරයකින් තොරව පෙ.ව.5.00 පෙර ඉවතට යෑමෙන් වැලකී සිටිය යුතුය.

**20.** සියලුම නේවාසිකාගාර වල සිටින නවක සිසුන් (පලමු වසර) ප.ව.6.00ට පෙර නේවාසිකාගාරයට ආපසු පැමිණිය යුතු අතර උපශාලාධිපතිගේ පූර්ව අවසරයකින් තොරව පෙ.ව.6.00 ට පෙර ඉවතට යැමෙන් වැලකී සිටිය යුතුය. ( ප.ව.6.00 න් පසුව සහ පෙ.ව.6.00ට පෙර ඉවතට යන සිසුන් විසින් නේවාසිකාගාරයෙහි සපයා ඇති වාර්තා පොතෙහි තමා ඉවතට යන හේතුව සහ වේලාව හෝ එන වේලාව සඳහන් කරමින් අත්සන් කරනු ලැබිය යුතුය).

**21.** කිසිම හේතුවක් නිසාවෙන් කිසිම පිරිමි සිසුවකු හෝ ගැහැණු සිසුවකු විසින් අදාල පරිදි ගැහැණු හෝ පිරිමි අයෙකු ඔහුගේ හෝ ඇයගේ කාමරයේ තබා නොගත යුතුය.

**22.** විශ්වවිද්‍යාලය විසින් විනයානුකූලව ක්‍රියාමාර්ග අනුව නේවාසිකාගාර හිමිකම අත්හිටුවා ඇති යම් සිසුවකුට නේවාසික නවාතැන් අපේක්ෂා කිරීම සඳහා හෝ නේවාසිකව දිගටම සිටීම සඳහා හිමිකම් නොමැත.

**23.** විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ට පොදුවේ අදාළ වන මෙම අතුරු නීතිවල විධිවිධාන , නේවාසිකාගාර වල සිටින සිසුන්ට හෝ ඔවුන් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස්කම් සහිතව අදාළ විය යුතුය.

**24. (1)** යම් අසාධ්‍ය හෝ බෝවන රෝගයකින් පෙළෙන යම් ශිෂ්‍යයකු විසින් ඔහු නේවාසිකාගාරයට පැමිණීමට පෙරාතුව, තමා රෝග බෝවීමේ ප්‍රවණතාවයෙන් නිදහස් බවට වූ වෛද්‍ය සහතිකයක් නේවාසිකාගාර ශාලාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**(2)** වෙනත් සිසුන්ගේ සහ පරිපාලන කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය කෙරෙහි ඇති තර්ජනය වලක්වාලනු ලැබිය යුතුය. යම් ශිෂ්‍යයකුට යම් සෞඛ්‍ය ගැටළුවක් ඇතිවුවහොත් , ඔහු විසින් වහාම වෛද්‍ය නිලධාරි හමුවිය යුතුය. ඒ පිළිබඳව වහාම උපශාලාධිපති වෙත වාර්තා කරනු ලැබිය යුතුය.

**25.** නේවාසිකාගාරයක සිටින පලමු වසර, අවසාන වසර හා විශේෂ අවසරලත් සිසුන් හැර අනෙක් සෑම ශිෂ්‍යයකු ම විසින් තමා පරිභෝජනය කරන , විදුලි බලය , ජලය සඳහා විශ්වවිද්‍යාල විසින් අනෙක් නිර්දේශ කරනු ලබන ගෙවීම කළ යුතුය.

**26.** දිවා හෝ රාත්‍රී කාලයේදී නේවාසිකාගාරයේ සෑම කොටසක්ම අධීක්ෂණය කිරීම සඳහා විශ්වවිද්‍යාල බලධාරීන්ට විවෘත විය යුතු අතර නේවාසිකාගාරයක අධීක්ෂණය කිරීම සඳහා ඕනෑම අවස්ථාවකදී විශ්වවිද්‍යාල බලධාරීන්ට සහාය වීම සෑම ශිෂ්‍යයකුගේම කාර්ය විය යුතුය.

**27.** නේවාසිකාගාර ඇතුලත දී ශිෂ්‍යයින්ගේ පුද්ගලික දේපල වලට සිදු වන අලාභ හෝ පාඩු සඳහා විශ්වවිද්‍යාලය වගකියනු නොලැබිය යුතුය.

**28.**විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරයේ අනවසරයෙන් නවාතැන් ගෙන සිටීම විශ්වවිද්‍යාලය පනවන දණ්ඩනයකට යටත් විය හැකි අතර නවාතැන් සිටි කාලයට විශ්වවිද්‍යාලය නියම කරනු ලබන දඩ මුදල් ගෙවිය යුතුය.

**දඬුවම්**

**29.**මෙම අතුරු නීති වල විධිවිධාන උල්ලංඝණය කරනු ලබන හෝ එම විධිවිධාන වලට එකඟව ක්‍රියා කිරීම පැහැර හරිනු ලබන යම් ශිෂ්‍යයකු විනය විරෝධී ක්‍රියා හෝ විෂමාචාර පිළිබඳ වරදට වරදකරු වන අතර එම ශිෂ්‍යයා පහත දැක්වෙන දඬුවම් වලට යටත් වන්නේය.

**(අ)** දැඩි ලිඛිත අවවාද කිරීමකට ;

**(ආ)** දඩමුදලක් පැනවීම ;

**(ඇ)** යම් නිශ්චිත කාල සීමාවක් සඳහා නේවාසිකාගාර පහසුකම් ඉවත් කිරීම හෝ අත්හිටුවීම;

**(ඈ)** විශ්වවිද්‍යාලයේ දේපළ වලට හානි සිදු කර ඇති අවස්ථාවකදී ශිෂ්‍ය සංගමය සඳහා වෙන් කර ඇති දීමනා අඩු කිරීම

**(ඉ)** වසර දෙකකට වැඩි නොවන කාලයක් සඳහා ශිෂ්‍ය භාවය අත්හිටුවීම ;

**(ඊ)** වසර දෙකකට නොවැඩි කාලයක් සඳහා විභාග ප්‍රතිපල අත්හිටුවීම ;

**(උ)** විශ්වවිද්‍යාලයෙන් නෙරපීමට ;

**(ඌ)** උපකුලපති හෝ පාලක සභාව විසින් අනුමත කරනු ලබන වෙනත් යම් දඬුවමක්

**විනයානුකූලව ක්‍රියාකිරීමේ කාර්ය පටිපාටිය**

**මූලික විමර්ශන**

**30. (1)** විනය විරෝධී ක්‍රියාවන් පිළිබඳ හෝ විෂමාචාර පිළිබඳ චෝදනාවක් හෝ මෙම අතුරු නීති උල්ලංඝණය කිරීමක් පිළිබඳව මූලික විමර්ශනයක් පැවැත්වීම සඳහා උපකුලපතිවරයා විසින් පරීක්ෂණ නිලධරයකු වශයෙන් යම් අධ්‍යයන සාමාජිකයකු හෝ සාමාජිකයන් තිදෙනෙකුට හෝ වැඩි ගණනකින් සමන්විත වන විනය කමිටුවක් පත් කරනු ලැබිය හැකිය.

**(2)** සාමාජිකයන් එක් අයෙකුට වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවකදී විනය කමිටුවේ සාමාජිකයින් අතරින් විනය කමිටුවේ සභාපතිවරයා උපකුලපති විසින් තෝරාපත් කරනු ලැබිය යුතුය.

**(3)** නියෝජ්‍ය / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර ලේඛකාධිකාරී(නීති හා ලේඛන) / (ශිෂ්‍ය කටයුතු) සහ (විභාග)හෝ ඔහුගේ නියෝජිතයකු විනය කමිටුවේ ලේකම් විය යුතු අතර ඔහු විනය කමිටුවේ උපදෙස් පරිදි විමර්ශන කරගෙන යාමට සාක්ෂි කැඳවීම ප්‍රකාශන ලබා ගැනීම ආදී කටයුතු සිදු කළ යුතුය.

**(4)** විමර්ශණය අවසානයේ දී , අවස්ථාවෝචිත පරිදි විමර්ෂණ නිලධාරී හෝ විනය කමිටුවේ සභාපති විසින් ඔහුගේ හෝ එහි නිර්දේශ සමඟ වාර්තාවක් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**31. (1)** ඉහත වගන්තිය ප්‍රකාරව නිර්දේශයක් ලැබීමෙන් පසුව උපකුලපතිවරයා විසින් , පහත සඳහන් තීරණ ගනු ලැබිය හැකිය.

**(අ)** චෝදනා නොමැති නම්, පරීක්ෂණ අවසන් කිරීම ;

**(ආ)** සුලු චෝදනා ඇත්නම් , අංක 29 දරන අතුරු නීතියේ නිශ්චිතව දක්වා ඇති ලිහිල් දණ්ඩනයන් පැනවීම.

**(2)** උපකුලපතිවරයා විසින් ගන්නා ලද තීරණ අදාල ශිෂ්‍යයා , සහ ඔහුගේ දෙමාපියන්ට හෝ භාරකරුට ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දෙනු ලැබිය යුතු අතර ඉහත කී ලිපියේ පිටපතක් නියෝජ්‍ය උපකුලපතිවරයාට, නේවාසික සහ විනය මණ්ඩලයේ සභාපති, අදාළ පීඨාධිපතිට , විනය පාලකට ,නියෝජ්‍ය ලේඛකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර ලේඛකාධිකාරී(නීති හා ලේඛන) / (ශිෂ්‍ය කටයුතු) සහ (විභාග), සහ වෙනත් යම් අදාළ තැනැත්තකු වෙත යවනු ලැබිය යුතු ය.

**විධිමත් පරීක්ෂණය**

**32.**ශිෂ්‍යයන් විසින් කරන ලද බරපතල ආකාරයේ විනය විරෝධී ක්‍රියාවකට හෝ විෂමාචාර හැසිරීමක් ඇති බවට අවස්ථාවෝචිත පරිදි පරීක්ෂණ නිලධාරීගේ හෝ මූලික විමර්ශන වාර්තාව මගින් උපකුලපතිවරයා සෑහීමකට පත්වන අවස්ථාවක දී , උපකුලපති විසින් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා තීරණය කරනු ලැබිය හැකි අතර ඒ පිළිබඳව උපකුලපති උපදෙස් පරිදි කටයුතු කිරීමට නියෝජ්‍ය උපකුලපතිට මූලික විමර්ශන වාර්තාව යොමුකළ යුතුය.

**33. (1)** උපකුලපති විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන නිලධාරීන් එක් කෙනෙකු හෝ තිදෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත විනය කමිටුවක් විධිමත් පරීක්ෂණය සිදු කරනු ලැබීම සඳහා පත්කරනු ලැබිය යුතු ය.

**(2)** මෙම අතුරුනීති යටතේ පත්කරනු ලබන විනය කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව එක් අයෙකුට වඩා වැඩි වන අවස්ථාවකදී විනය මණ්ඩලයේ සභාපති වරයා උපකුලපතිවරයා විසින් නම්කරනු ලැබිය යුතු ය.

**(3)** සහකාර / ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී (නීති හා ලේඛන)හෝ ඔහුගේ නියෝජිතයකු විනය මණ්ඩලයේ ලේකම්වරයා විය යුතුය.

**(4)** මූලික විමර්ෂණ වාර්තාව පදනම්කරගනිමින් සකස් කරන ලද එක් එක් ශිෂ්‍යයා සඳහා චෝදනා පත්‍රය උපකුලපතිවරයා විසින් අත්සන් කර චූදිත ශිෂ්‍යයාට සහ ඔහුගේ දෙමාපියන්ට හෝ භාරකරුට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය යුතුය.

**(5)** ඉදිරිපත් කරන ලබන චෝදනා සඳහා චූදිත ශිෂ්‍යයා ගේ පිලිතුරු ප්‍රකාශය ඔහු විසින් සති දෙකක කාලයක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් උපකුලපති වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

**(6)** පිලිතුරු ප්‍රකාශය සම්බන්ධව පිලිගත හැකි කරුනු තිබේ නම් උපකුලපතිවරයා විසින් චූදිත ශිෂ්‍යයා චෝදනා වලින් නිදහස් කලහැකි අතර එසේ නොවේ නම් විධිමත් පරීක්ෂණය පැවැත්වීමට කටයුතු කලහැක.

**(7)** විනය මණ්ඩලයේ සමාජිකයන් වෙත සාක්ෂි ලැයිස්තුවක් සහ පරීක්ෂණයට අදාළ වෙනත් සියලු අදාළ වාර්තා , ද්‍රව්‍ය විනය මණ්ඩලයේ ලේකම් විසින් ලබා දිය යුතුය.

**(8)** විනය මණ්ඩලයේ ලේකම් විසින් විධිමත් පරීක්ෂණය සඳහා සාක්ෂි ලබා දීමට තැනැත්තන් විනය මණ්ඩලයේ උපදෙස් පරිදි කැඳවනු ලැබිය යුතුය.

**(9)** පරීක්ෂණය මාස දෙකක් නොඉක්මවන කාලයක් ඇතුලත සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

**(10)** පරීක්ෂණය අවසානයේ දී , විනය මණ්ඩලය විසින් ස්වකීය නිර්දේශ ද සමග වාර්තාවක් උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර උපකුලපතිවරයා විසින් දඬුවම් පැනවීම හෝ පාලක සභා උපදෙස් ලබා ගෙන දඬුවම් පැමිණවීමට තීරණය කළ යුතුය.

**(11)** ඉහත කී තීරණය කල දඬුවම ලියාපදිංචි තැපෑලෙන් අදාළ ශිෂ්‍යයාට සහ දෙමාපියන්ට හෝ භාරකරුට යවනු ලැබිය යුතු අතර එම ලිපියේ පිටපතක් නියෝජ්‍ය උපකුලපතිවරයාට , අදාළ පීඨාධිපතිට, විනය පාලක සහ මණ්ඩලයේ සභාපතිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය ලේඛකාධිකාරී / ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර ලේඛකාධිකාරී(නීති හා ලේඛන) / (ශිෂ්‍ය කටයුතු) සහ (විභාග)සහ වෙනත් යම් අදාළ තැනැත්තකු වෙත යවනු ලැබිය යුතුය.

**අභියාචනා**

**34. (1)** යම් දණ්ඩන පැනවීමේ තීරණයක් මගින් අතෘප්තියට පත් යම් වූදිත ශිෂ්‍යයකු විසින් එම දණ්ඩණය පිළිබද දැනුම් දීමේ සන්නිවේදනය ලිඛිතව ලැබීමේ දිනයේ සිට දින 14 ක් ඇතුලත එම තීරණයට එරෙහිව අදාළ පීඨාධිපති මගින් උපකුලපතිවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

**(2)** එම අභියාචනය උපකුලපතිවරයා විසින් නේවාසික සහ විනය මණ්ඩලයේ නිර්දේශය ලබා ගැනීමට ඉදිරිපත් කල යුතු ය.

**(3)** අභියාචනා මණ්ඩලය වශයෙන් නේවාසික සහ විනය මණ්ඩලය එම අභියාචනය සලකා බැලීම සඳහා එම මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු උපකුලපතිගේ එකඟත්වය පරිදි නම් කල යුතු ය.

**(4)** නියෝජ්‍ය /ජ්‍යෙෂ්ඨ / සහකාර ලේඛකාධිකාරී (නිති හා ලේඛන) හෝ ඔහුගේ නියෝජිතයකු අභියාචන මණ්ඩලය වෙත විධිමත් පරීක්ෂණ වාර්තාව, වෙනත් අදාළ වාර්තා , ද්‍රව්‍ය , යනාදිය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**(5)** විමර්ශන අවසානයේ දී, අභියාචන මණ්ඩලය විසින් ස්වකීය නිර්දේශ ද සමග නේවාසික හා විනය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර එය නේවාසික විනය මණ්ඩලයේ සාකච්ඡා කර අවසාන තීරණ ගැනීම නිර්දේශ සමග උපකුලපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු ය.

**(6)** උපකුලපතිවරයා විසින් ගන්නා ලද තීරණය ලියාපදිංචි තැපෑලෙන් අදාළ ශිෂ්‍යයාට සහ දෙමාපියන්ට හෝ භාරකරුට යවනු ලැබිය යුතු අතර එම ලිපියේ පිටපතක් නියෝජ්‍ය උපකුලපතිවරයාට , අදාළ පීඨාධිපතිට, විනය පාලකට සහ මණ්ඩලයේ සභාපතිට නියෝජ්‍ය ලේඛකාධිකාරී /ජ්‍යෙෂ්ඨ සහකාර / සහකාර

ලේඛකාධිකාරී(නීති හා ලේඛන) / (ශිෂ්‍ය කටයුතු) සහ (විභාග)සහ වෙනත් යම් අදාළ තැනැත්තකු වෙත යවනු ලැබිය යුතුය.

**විවිධ**

**35.** නියෝජ්‍ය උපකුලපති සහ යම් ශිෂ්‍ය උපදේශකවරයකු විනය පරීක්ෂණ මණ්ඩලයට තෝරා පත්කිරීම සඳහා යෝග්‍ය නොවන්නේය.

**36.** මෙම අතුරු නීති වල , විධිවිධාන වල පටහැනිව කුමක් සඳහන් වුවද , විශ්වවිද්‍යාලයේ විනය පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය බවට උපකුලපතිවරයා විසින් සලකනු ලබන යම් උචිත පියවරක් උපකුලපතිවරයා විසින් ගනු ලැබිය යුතුය.

**37.** මෙම අතුරු නීති විශ්වවිද්‍යාල පරිශ්‍රය ඇතුළත අදාළ විය යුතුය.

**38. (1)** විශ්වවිද්‍යාල සිසුන් විසින් සියලු අවස්ථාවලදී විශ්වවිද්‍යාලයේ හොඳ නම , ගෞරවය සහ කීර්ති නාමය ආරක්ෂා කිරීම සඳහා මෙහෙයවිය යුතුය.

**(2)** විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයකුම මනා හැසිරීමක් ඇති තැනැත්තකු විය යුතු මෙන්ම සියලු අවස්ථාවලදී උපාධි අපේක්ෂක හෝ උපාධිධාරී සිසුවකුගේ තත්වය ආරක්ෂා වන ආකාරයේ යථා පැවැත්මක් ඇති ආකාරයෙන් හැසිරිය යුතු ය.

**(3)** විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයකුම විසින් තමා නේවාසිකව සිටින නේවාසිකාගාරයේ කීර්තිනාමය සහ ගෞරවය ආරක්ෂාවන ආකාරයෙන් හැසිරිය යුතු ය.

**(4)** විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද ශිෂ්‍ය හැඳුනුම්පත සෑම ශිෂ්‍යයකුම විසින් තබාගත යුතු අතර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය , ආරක්ෂක නිලධරයකු හෝ වෙනත් යම් බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටීමේදී එය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**(5)** මෙම අතුරු නීති, විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයකුටම අදාළ විය යුතුය.

**(6)** 2015 අංක 01 දරන ශිෂ්‍ය අතුරු නීතිවල පිටපතක් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පිළිගැනීමේ සහතිකයේ ආකෘතිය ද සමග විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍යයකු වෙතම ඉදිරිපත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතුය. සෑම ශිෂ්‍යයකුම විසින් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී වෙත වහාම සම්පූර්ණ කරන ලද පිළිගැනීමේ සහතික පත්‍රය ආපසු භාරදෙනු ලැබිය යුතු ය.

**39.** සෑම ශිෂ්‍යයකු වෙත උපාධිය, ඩිප්ලෝමා , සහතික පත්‍රය හෝ වෙනත් යම් අධ්‍යයන කුසලතාවය පිලිබඳ යෝග්‍යතාවය නිශ්චය කිරීමේදී එක් එක් ශිෂ්‍යයකුගේ හැසිරීම තීරණය කිරීමට සහ තක්සේරු කිරීමට විශ්වවිද්‍යාලයට සම්පූර්ණ බලය සහ අධිකාරිය තිබිය යුත්තේ ය.

**40.** මෙම අතුරු නීති වල -

"බලයලත් නිලධරයා" යන්නෙන් උපකුලපතිවරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු අදහස් වේ.

"විශ්වවිද්‍යාල පරිශ්‍රය" යන්නෙන් විශ්වවිද්‍යාලයේ පහසුකම් පිහිටා ඇති පරිශ්‍රයන්, නේවාසිකාගාර, විශ්වවිද්‍යාල විසින් පාලනය කරනු ලබන විශ්වවිද්‍යාල පරිශ්‍රය හෝ විශ්වවිද්‍යාල කටයුතු කරගෙන යනු ලබන වෙනත් යම් පරිශ්‍රයක් අදහස් වේ.

**41.** යම් හෙයකින් සිංහල, ඉංග්‍රීසි, හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

**උපලේඛනය**

රුහුණු විශ්වවිද්‍යාලය

ශිෂ්‍ය විනය සහ නේවාසික අතුරු නීති

පිළිගැනීමේ සහතිකය

---

රුහුණ විශ්වවිද්‍යාලයේ 2015 අංක 01 දරන නේවාසික සහ ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු නීති වල පිටපතක් මා හට ලැබුණු බවත් , මා විසින් එම අතුරු නීති වල විධි විධාන උනන්දුවෙන් කියවා අවබෝධ කරගත් බවටත්, මෙයින් සහතික කොට ප්‍රකාශ කරමි. එකී අතුරු නීතිවල විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීමට මම එකඟ වෙමි.

නම :- …………………………………………………………..

පීඨය :- …………………………………………………………..

අධ්‍යයන වැඩසටහන :- ……………………………………………

අ.පො.ස.(උ.පෙ.) විභාග අංකය :- ……………………………

ජා.හැ.පත් අංකය :- ……………………………………………

දිනය: -………………………..

.......................................

ශිෂ්‍යයාගේ අත්සන

ඉහත කී අතුරු නීති වලට අනුව කටයුතු කිරීමට මාගේ පුතා/ දියනිය එකග වන බවට ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ තැබූ බවට මෙයින් සහතික කරමි.

දිනය :……………………

..................................

දෙමාපිය/භාරකරු

අත්සන

නම :-………………………....